**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී ,වංචා හෝ වැරදි හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතු 02 ක ඉකුත් වර්ෂයට අදාළ රු.580,323 ක පොලිය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පසුගිය වර්ෂයේ ආදායමට ගැලපීම සිදු කර නොමැති බව | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ඉදිරි වර්ෂයේ දී ගෙවිය යුතු රු.1,433,032 ක ණය වාරිකය දිගු කාලීන වගකීම් යටතේ දක්වා තිබුණි. | 2022 ගිණුම් වර්ෂයේ නිවැරදි කරන බව | ඉදිරි වසර තුළ ගෙවිය යුතු ණය වාරික ජංගම වගකීම් යටතේ දැක්විය යුතුය |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ පෙන්වා දුන් වැරදි සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේ දී, ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.2,725,000 ක් වැඩියෙන් ද, ප්‍රත්‍යාගණන අගය රු.10,256,826 ක් හා කර්මාන්ත ණයහිමි අගය රු.54,268 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ජ'නල් සටහන් මඟින් නිවැරදි වටිනාකම ගිණුම්වල ගලපා ඇති බව දන්වා ඇත | වාර්ෂික ගිණුම් විගණනයේ දී පෙන්වා දෙන ගිණුම්කරණ අඩුපාඩු නිවැරදිව ගිණුම්වල ගැළපිය යුතුය |
| (ඈ) | ඉඩම් හා ගොඩනැගිලි ඒකක 93 ක වටිනාකම විධිමත්ව නිවැරදි අගයට තක්සේරු නොකර, රු.257,500 ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | තාවකාලික තක්සේරුවක් ලබා දී ඇති බව | වත්කම් වර්තමාන වෙළඳ පොළ අගයන් මත නිවැරදිව තක්සේරු කළ යුතුය |

1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.1,017,017 ක වත්කම් විෂයයන් 03 ක් සහ රු.45,640,792 ක බැරකම් විෂයයන් 02 ක් ලේඛන, සමීක්ෂණ වාර්තා හා කේවළ ශේෂ ලැයිස්තු ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ලද පරිත්‍යාග මුදල් සඳහා ලේඛනයක් ආරම්භ කළ අතර, අනෙකුත් ශේෂ සඳහා ලේඛන සකස් කර ඇති බව | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ තහවුරු කරන සාක්ෂි පිළියෙල කළ යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,689,826 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,002,705 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වරිපනම් | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොකළ හිඟ හිටි වරිපනම් බදු ආදායම රු.12,800,300 ක් වූ අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි වසර 05 ඉක්ම වූ වරිපනම් ඒකක 282 කින් අය විය යුතු රු.2,205,178 ක් ද, පාරිභෝගිකයින්ගේ නම වරිපනම් ලේඛනයේ නොදක්වා “අයිතිකරු” ලෙස ශේෂය සටහන් කර ඇති ඒකක 450 කින් අය විය යුතු රු.609,065 ක් ද, රජයේ ආයතන 53 කින් අය විය යුතු රු.85,641 ක් ද ඇතුළත්ව තිබුණි. | ජංගම සේවා පැවැත්වීමත්, නිවසින් නිවසට වරිපනම් ගාස්තු එකතු කිරීම හා රතු නිවේදන නිකුත් කිරීමත් සිදු කරමින් පවතින බව | හිඟ වරිපනම් බදු අය කළ යුතුය |

(ආ) හිඟ හිටි නළ ළිං ආදායම

--------------------------

| | | |
|---|---|---|
| වසර 05 කර අධික කාලයක සිට පැවත එන බිල් කර තිබුණු රු.3,920,055 ක නළ ළිං ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ද අය කර නොතිබුණි. | මේ වන විට නළ ළිං බිල් කිරීම නවතා ඇති බවත්, දිගින් දිගටම පැවති හිඟ මුදල කපා හැරීමට මහා සභාව අනුමත කර ඇති බව | හිඟ නළ ළිං ආදායම් අය කළ යුතුය |

(ඇ) ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු

------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ත්‍රීරෝද රථ සංගම් 27 කින් අය විය යුතු රු.1,608,850 ක ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ එක් ත්‍රීරෝද රථ සංගමයක මුලු බලපත්‍ර ගාස්තු හිඟය රු.50,000 ඉක්ම වූ සංගම් 15 කින් අය විය යුතු ගාස්තු රු.1,332,450 ක් ඇතුළත්ව තිබුණි. | අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව | හිඟ ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කර ගත යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

----------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් රු.2,938,260 ක වාහන 04 ක් 2016 සහ 2017 වර්ෂවල සිට අපහරණය සඳහා භාවිතයෙන් ඉවත් කර තිබුණ ද , සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද අපහරණය කර නොතිබුණි. | මෙම වාහන අපහරණ තත්ත්වයේ පවතින බවත්, තක්සේරු වාර්තා කැඳවා දැනට වෙන්දේසි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතින බව | අදාළ වාහන අපහරණය කළ යුතුය |